# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/9/2018 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2018.12. 20 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 12-2018**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන්,
ප්‍රධාන ගණකාධිකාරී වරුන්
හා ගණකාධිකාරීවරුන් වෙත.

## විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම හා විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන III) හා 2018.11.09 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

**02.**එමගින් ඉහත කරුණ සම්බන්ධව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2009.08.21 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009, 2011.05.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන I) හා 2011.08.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන II) ට අමතර වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත. (එම චක්‍රලේඛ වල පිටපත් මේ සමග අමුණා ඇත.)

**03.**ඒ අනුව 2011.08.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන II) හි 01 මගින් දක්වා ඇති කරුණු, අංක 2084/59 හා 2018 අගෝස්තු මස 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව පහත පරිදි සංශෝධනය කර ඇත.

01. (අ) 2012 මාර්තු මස 19 වැනි දින හෝ ඉන් පසුව විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අය කළ යුතුය.

(ආ) 2012 මාර්තු මස 19 දිනට පෙර නැවත සේවයේ යොදවාගත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී කලින් ඔවුන් වෙත කරන ලද ප්‍රදානය අනුව ගෙවන ලද පාරිතෝෂිකයෙන් අදාළ දිනය දක්වා අය කරන ලද පාරිතෝෂිකයේ වටිනාකම හැර ඉතිරි පාරිතෝෂිකයේ වටිනාකම සංශෝධනයෙන් පසු හිමි පාරිතෝෂිකයෙන් අඩුකර අවශ්‍ය ගැලපීම් සිදු කර ආපසු ගෙවිය යුතු මුදලක් වේ නම් ගෙවීම් කල යුතුය.

02. විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම පිළිබඳව 2018.02.20 දින නිකුත් කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 චක්‍රලේඛය මගින්, ඊට පෙර නිකුත් කල 2007.05.11 දිනැති අංක 09/2007 දරන චක්‍රලේඛය සහ එයට අදාල සංශෝධන ඇතුලත් චක්‍රලේඛ අවලංගු කර ඇත. එබැවින් 03/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන 2018.02.01 දින සිට බලාත්මක වේ.

04. මෙම චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙස දැනුම් දෙන අතර, මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:-

01.සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / පිරිස් හා පුහුණු) : අ.ක.ස.
03.අධ්‍යක්ෂ( අයවැය / ගිණුම් හා ගෙවීම් ) : අ.ක.ස.
04.අධ්‍යක්ෂ, දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව : දැ.ගැ.ස

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ : 15/2009 (සංශෝධන III)

මගේ අංකය - විවැ/චක්‍රලේඛ/2018,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10,
2018.11.09

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් ,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

## විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම හා විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම

ඉහත කරුණ සම්බන්ධව මවිසින් නිකුත් කරන ලද 2009.08.21 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009, 2011.05.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන I) හා 2011.08.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන II) ට අමතර වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2011.08.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2009 (සංශෝධන II) හි 01 මඟින් දක්වා ඇති කරුණු , අංක 2084/59 හා 2018 අගෝස්තු මස 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සංශෝධනය කරමි.

01. (අ) 2012 මාර්තු මස 19 වැනි දින හෝ ඉන් පසුව විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ දී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අය කළ යුතුය.

(ආ) 2012 මාර්තු මස 19 දිනට පෙර නැවත සේවයේ යොදවාගත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී කලින් ඔවුන් වෙත කරන ලද ප්‍රදානය අනුව ගෙවන ලද පාරිතෝෂිකයෙන් අදාළ දිනය දක්වා අය කරන ලද පාරිතෝෂිකයේ වටිනාකම හැර ඉතිරි පාරිතෝෂිකයේ වටිනාකම සංශෝධනයෙන් පසු හිමි පාරිතෝෂිකයෙන් අඩුකර අවශ්‍ය ගැලපීම් සිදු කර ආපසු ගෙවිය යුතු මුදලක් වෙත් නම් ගෙවීම් කල යුතුය.

02. විශ්‍රාමික රජයේ නිළධරයන් නැවත සේවයේ යෙදවීම පිළිබඳව 2018.02.20 දින නිකුත් කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 චක්‍රලේඛය මගින්, ඊට පෙර නිකුත් කල 2007.05.11 දිනැති අංක 09/2007 දරන චක්‍රලේඛය සහ එයට අදාල සංශෝධන ඇතුලත් චක්‍රලේඛ අවලංගු කර ඇත. එබැවින් 03/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන 2018.02.01 දින සිට බලාත්මක වේ.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-
1. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ. සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ. සඳහා
3. ලේකම් - රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍යාංශය - කරු. දැ.ගැ. සඳහා
4. ලේකම් - මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කරු. දැ.ගැ. සඳහා
5. විගණකාධිපති - කරු. දැ.ගැ. සඳහා

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2009- 08- 21

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15 /2009

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

## විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම

*"විශ්‍රාම ලැබූ රජයේ නිලධාරියෙකු සේවා කඩවීමකින් පසු විශ්‍රාම වැටුප් සහිත තනතුරක නැවත සේවයේ නියුක්ත කරනු ලැබ එම සේවයෙහි යොදවන ලද තනතුරෙන් විශ්‍රාම ගැනීමේදී, එම දිනයෙහි වූ ප්‍රතිශෝධිත වැටුප මත කල්පිත පදනමින් ඔහුගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කළ යුතුය".*

මේ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 අ ආ වගන්තියෙහි ඉහත අතුරු විධානයට අනුව විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කර ගත හැකිවේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/ 2007 විධිවිධානයන්ට අනුව යලි සේවයේ යොදවන විශ්‍රාමික නිලධාරීන්ට ගෙවනු ලබන මාසික දීමනාව සහ අනෙකුත් පහසුකම් තීරණය කොට ඇත. ඒ අනුව එම නිලධාරීන්ට ගෙවිය හැකි වන්නේ කිසියම් මාසික දීමනාවක් හෝ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% කට සමාන දීමනාවක් පමණි. කෙසේ වෙතත් විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමේදී ඔහුනට ගෙවනු ලැබූ දීමනාව හෝ වැටුප් ප්‍රතිශතය නොසලකා අදාල තනතුරට හිමිවිය යුතු කල්පිත වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කළ හැකි බව කාරුණිකව දන්වමි.

මෙම විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයේදී පහත සඳහන් ලේඛණ අමුණා එවිය යුතු වේ.

1. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 අ ආ වගන්ති අනුව නැවත සේවයෙහි යෙදවූ නිලධාරීන් සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍රය. (අමුණා ඇත)
2. සංශෝධිත වැටුප් වාර්තා සහ වැටුප් පරිවර්තන ලිපි.
3. යලි සේවයෙහි යෙදවීමට අදාල පත්වීම් ලිපිය.
4. එම සේවය අවසන් කිරීමේ ලිපිය.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
03. විගණකාධිපති.

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 "අ" (ආ) වගන්තිය අනුව නැවත සේවයේ යෙදවූ රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් සැපයිය යුතු විස්තර

1. නම සහ ලිපිනය :-

2. විශ්‍රාම වැටුප් අංකය :-

3. බැංකුවේ නම සහ ගිණුම් අංකය :-

4. දරණ ලද විශ්‍රාම වැටුප් හිමි තනතුර :-

5. නැවත සේවයේ යෙදවූ දිනය :-

6. නැවත සේවයේ යෙදවූ කාලපරිච්ඡේදය තුළ දැරූ විශ්‍රාම වැටුප් හිමි තනතුර :-

7. නැවත සේවයේ යෙදවූ කාලපරිච්ඡේදය :-

8. නැවත සේවයේ යෙදවූ කාලපරිච්ඡේදය තුළ වැටුප් ගෙවූ මූලාශ්‍රය (පුද්ගල පඩි නඩි අත්තිකාරම් ගිණුම් ආදියෙන් යන වග) :-

9. නැවත සේවයේ යෙදවූ තනතුර අත්හල දිනය :-

10. අංක 15/2003 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අනුරූපී වැටුප සහ වැටුප් ක්‍රමය :-

11. අංක 9/ 2004 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අනුරූපී වැටුප සහ වැටුප් ක්‍රමය :-

12. අංක 6/2006 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අනුරූපී වැටුප සහ වැටුප් ක්‍රමය :-

13. අංක 9/ 2007 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය :-
අනුව අනුරූපී වැටුප සහ වැටුප් ක්‍රමය

14. යලි විශ්‍රාම ගැන්වූ දිනට අදාල වැටුප් පරිමාණය :-
සහ විශ්‍රාම වැටුප ගණන් බැලීමට අදාල
කල්පිත වැටුප

මෙම කාර්යාලයේ ඇති ලේඛණ අනුව ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් නිලධාරියා නැවත සේවයට බඳවා ගැනීමේ පදනම මත ........................... දින සිට ........................... දින දක්වා ............................. සේවය කර ඇති බව සහතික කරමි.

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලබා හයමසක අතිරේක පාරිතෝෂිකයක් ලබා ගත් වයස අවු. 55 ට අඩු අයට මෙම සංශෝධනය අදාල නොවේ).

.............................................
සහතික කරන නිලධාරියාගේ
නම සහ තනතුර

දිනය: .......................

සැ.යු. 03. මෙම ආකෘතිපත්‍ර පිරවිය යුත්තේ නැවත සේවයේ යොදවා ගත් නිලධාරියා විසින් නොව අදාල අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසිනි.

04. වැටුප් පරිවර්තනයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ එවිය යුතුය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:09/2007

මගේ අංකය:ආ/4/2/2/45
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2007.05.11

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම.

විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම පිළිබඳව පවත්නා විධිවිධාන සමාලෝචනය කල අමාත්‍ය මණ්ඩලය ඒවා සංශෝධනය කල යුතු බවට තීරණය කර තිබේ. ඒ අනුව ප්‍රස්තුත කාරණයට අදාලව මේ දක්වා බලපැවැත්වූ 2003.01.03 දිනැති 1/2003 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර පහත සඳහන් විධිවිධාන 2007.04.01 දින සිට ක්‍රියාත්මක වේ.

(i). විශ්‍රාමිකයන් නැවත සේවයේ යෙදවිය යුත්තේ සුදුසු අනුප්‍රාප්තිකයන් සොයා ගැනීමට අපහසු සහ පුරප්පාඩුව පිරවීම අත්‍යවශ්‍ය තනතුරුවල පමණකි.

(ii). විශ්‍රාමික නිලධාරියකු නැවත සේවයේ යෙදවීමට පත්කිරීම් බලධාරියා වෙත නිර්දේශ කල යුත්තේ එම තනතුරට පත්කිරීම සඳහා අවශ්‍ය වන බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කල නිලධාරියකු නොමැති බවට අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා පෞද්ගලිකව සෑහීමකට පත්වීමෙන් අනතුරුවය. අමාත්‍යාංශයක් යටතට නොගැනෙන දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් වනවිට දෙපාර්තමේන්තු ප්‍රධානියා පෞද්ගලිකවම මෙම අවශ්‍යතාවය පිළිබඳව සෑහීමකට පත්විය යුතුය.

(iii). විශ්‍රාමිකයන් නැවත සේවයේ යෙදවීම මාස දොළහක (12) කාල පරිච්ඡේදයකට සීමා කරනු ලැබේ.

(iv). එසේ නැවත සේවයේ යොදවනු ලබන කාලසීමාව තුළදී ආයතන ප්‍රධානියා විසින් සුදුසු අනුප්‍රාප්තිකයකු හඳුනා ගනු ලැබිය යුතු අතර එම නිලධාරියා පුහුණු කිරීමේ කාර්යය නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධාරියාගේ වගකීමක් වශයෙන් ඔහුට පවරනු ලැබිය යුතුය.

(v). පත්කරනු ලබන දිනයට වයස අවුරුදු 67 සම්පූර්ණ කල කිසිවෙකු නැවත රාජ්‍ය සේවයේ අනුමත කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරකට පත් නොකල යුතුය.

02. විශ්‍රාමික නිලධාරියකු නැවත සේවයේ යොදවනු ලැබූ විට/තනතුරකට පත් කරනු ලැබූ විට පහත සඳහන් දීමනා සහ අනෙකුත් පහසුකම් ලබා දිය යුතුය.

| | පත්වීම කරනු ලබන තනතුර | මාසික දීමනාව | අනෙකුත් පහසුකම් |
|---|---|---|---|
| | 1 | 2 | 3 |
| (i) | අමාත්‍යාංශ ලේකම් හෝ සමාන තනතුරු | විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු. 30000/- ක් යන දෙකින් වැඩි මුදල | |
| (ii) | අතිරේක ලේකම් /අධ්‍යක්ෂ ජනරාල් හෝ සමාන තනතුරු | විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු. 25000/- ක් යන දෙකින් වැඩි මුදල | අදාල තනතුරට හිමි අනෙකුත් වරප්‍රසාද |
| (iii) | දෙපාර්තමේන්තු | | |

| | | | |
|---|---|---|---|
| (iv) | විධායක නිලධාරීන්, දිප ව්‍යාප්ත සේවාවල II/III ශ්‍රේණි හෝ ඊට සමාන තනතුරු | විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු. 17500/- ක් යන දෙකින් වැඩි මුදල | |
| (v) | භෙද, භාෂා පරිවර්තක වැනි ප්‍රමාණවත් නිලධාරීන් නොමැති සේ සැලකෙන වෙනත් තනතුරු | විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු. 15000/- ක් යන දෙකින් වැඩි මුදල | අදාල තනතුරට හිමි අනෙකුත් වරප්‍රසාද |
| (vi) | ද්විතික ශ්‍රේණියේ තනතුරු | විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු.10,000/- යන දෙකින් වැඩි මුදල | |

03. නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ දරූ තනතුරට වඩා පහල තනතුරකට (එනම් අඩු වැටු පරිමාණයක් සහිත තනතුරකට) නැවත පත්කර ඇත්නම් ඉහත 02 වන ජේදයේ "විශ්‍රාම යා අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක්" යන්න වෙනුවට "නැවත පත්කර ඇති තනතුර අයත් ශ්‍රේණියේ අදල පංතියට/ශ්‍රේණියට නියමිත වැටුප් සීමාවේ උපරිමයෙන් 50% ක් හෝ" යන් ආදේශ විය යුතුය.

<u>උදහරණ:</u> ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ සිට විශ්‍රාම ලැබූ නිලධාරියකු එම සේවයේ ලෙ ඊට සමාන සේවයක III පංතියේ තනතුරක නැවත සේවයේ යොදවනු ලැබුවහොත් 50% වැටු ගණනය කිරීම සඳහා එස් එල් 1- 2006 වැටුප් පරිමාණයේ රු.29385/- (II වැනි පියවර) යෙ ගත යුතුය.

04. මෙම චක්‍රලේඛය යටතේ විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ගණන කිරීම සඳහා විශ්‍රාම යන අවස්ථාවේ දරූ තනතුර සඳහා නැවත සේවයේ යොදවනු ලබන අවස්ථා ක්‍රියාත්මකව පැවති වැටුප් පරිමාණය යොද ගත යුතුය.

05. නැවත සේවයේ යොදවනු ලැබූ/පත් කරනු ලැබූ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප අඩුරා නැබීමක් නොරව දිගටම ගෙවනු ලැබේ. ඔවුන්ට විශ්‍රාම වැටුප සමග නියමිත ජීවන වියදම් දීමනාව ලැබේ අතර සේවයේ යෙදවීම/පත් කිරීම යටතේ ජීවන වියදම් දීමනා හිමි නොවේ.

06. 2007.04.01 දින වන විට සේවයේ යොදවනු ලැබ ඇති /පත් කරනු ලැබ ඇති තැනත්තන් සේවා නියමයන් හා කොන්දේසි ඔවුන්ගේ එකී කොන්ත්‍රාත් කාලය නිම වනතුරු තව දුරටත් එලෙ බල පැවැත්වෙනු ඇත.

07. රජයේ සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් අනතුරුව ස්ථිර හෝ තාවකාලික තනතුරකට පත් කර ලබන සියළුම පුද්ගලයන්ට මෙම චක්‍රලේඛය අදල වේ.

08. නැවත සේවයේ යොදවනු ලැබූ /පත් කරනු ලැබූ තනතුරට අදල විය යුතු දීමනාව සහ අනෙ පහසුකම් සම්බන්ධයෙන් ගැටළුවක් ඇත්නම් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කල යුත ආයතන අධ්‍යක්ෂ ජනරාල් මහා භාණ්ඩාගාරයේ නිර්දේශය මත අදල විය යුතු දීමනාව සහ අනෙ පහසුකම් පිළිබඳ උපදෙස් නිකුත් කරනු ඇත.

09. 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි 15:1 උපවගන්තියේ පළමු වාක්‍යය ඉහත 06 වන ජේදයේ නියමයන්ට අගතියක් නොවන පරිදි 2007.04.01 දින සිට ඉ කරනු ලැබේ.

10. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ඩී.දිසානායක

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාළිගාවත්ත කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2011 දිනය / திகதி / Date 2011-05-05

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/ 2009 (සංශෝධන I)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

## විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම

විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමට අදාලව මවිසින් නිකුත් කරන ලද 2009- 08- 21 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 15/ 2009 ට වැඩිමනක් වශයෙනි.

රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් විශ්‍රාම ලබා, කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා ඔහු/ ඇය වෙනුවෙන් නිකුත් කරනු ලබන පත්වීම් ලිපියේ වැටුප් වර්ධක අගයන් ලබාදෙන බවට සඳහන් කර ඇත්තේ නම් පමණක් වැටුප් වර්ධක අගය ගණනය කොට විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කළ හැකිය. කෙසේ වෙතත්, පත්වීම් ලිපියේ වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධව සඳහන් කොට නොමැති විට වැටුප් වර්ධක අගය ගණනය කිරීමකින් තොරව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කළ යුතුය.

එමෙන්ම විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනයට අඛන්ඩව වසර 02 ක් සේවය කිරීම අත්‍යාවශ්‍ය වන බවද කාරුණිකව දන්වමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
03. විගණකාධිපති.
04. ප්‍රධාන ගණකාධිකාරී - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත, ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No: විවැ/චක්‍රලේඛ/2011 දිනය / திகதி / Date: 2011-08-01

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/ 2009 (සංශෝධන II)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

**විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම හා**
**විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම**

උක්ත මැයෙන් මවිසින් නිකුත් කරන ලද 2009- 08- 21 දිනැති 15/ 2009 හා 2011- 05- 05 දිනැති 15/ 2009 සංශෝධන (I) චක්‍රලේඛ වලට අමතර වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

විශ්‍රාමික රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කරන අවස්ථාවන්හිදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස මින් උපදෙස් දෙමි.

01. විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේදී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අයකළ යුතුය.

02. ඉහත සඳහන් කරුණු හැරුනු කොට විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සංශෝධනය වී, විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල සංශෝධනය වන සෑම අවස්ථාවකදීම පෙර ගෙවන ලද පාරිතෝෂික මුදල සම්පූර්ණයෙන්ම නව පාරිතෝෂික මුදලින් අයකළ යුතුය.

උදා: 01. විශ්‍රාම යාමෙන් අනතුරුව සිදුවන වැටුප් වැඩිවීමකදී සිදුවන සංශෝධන

02. විශ්‍රාම ගොස් සිටින අවස්ථාවකදී සේවයේ සිටි කාලයට බලපැවැත්වෙන පරිදි දෙනු ලබන උසස් වීමක් හේතුවෙන් විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සංශෝධනය වන අවස්ථා.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
03. විගණකාධිපති.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 03/2018

මගේ අංකය: EST-4/02/REM/0197
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.02.20

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම

විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම පිළිබඳව විධිවිධාන ඇතුළත් 2007.05.11 දිනැති 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එයට සංශෝධන ඇතුළත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මෙයින් අවලංගු කරන අතර පහත සඳහන් විධිවිධාන 2018.02.01 දින සිට ක්‍රියාත්මක වේ.

02. අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අනෙකුත් රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් තම මානව සම්පත් අවශ්‍යතා, අනෙකුත් සංවර්ධන සැලසුම් සමඟ කල් ඇතිව හඳුනාගැනීමත්, ඉදිරි මානව සම්පත් අවශ්‍යතා එකවරම හඳුනාගැනීමට හැකිවන පරිදි තම කාර්ය මණ්ඩලයේ නිලධරයන් පිළිබඳ තොරතුරු සූදානම් කර තබාගැනීම සහ තම ආයතනයේ නිලධරයන් විශ්‍රාම ගැනීම නිසා හෝ උසස්වීම් ලැබීම නිසා පුරප්පාඩු වන තනතුරුවලට පත් කළ යුතු සුදුසු පුද්ගලයන් කල් වේලා ඇතිව හඳුනාගැනීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු අතර එමඟින් සුදුසු නිලධරයෙකු හඳුනාගත නොහැකි වන්නේ නම් පමණක් පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

I. වයස අවුරුදු 60 ඉක්ම වූ විශ්‍රාමිකයකු රජයේ සේවයේ අනුමත තනතුරක සේවයේ නොයෙදවිය යුතුය.

II. එහෙත් අනුප්‍රාප්තිකයෙකු පත් කිරීමට අපහසු වූ ද, වැඩබැලීම වැනි විකල්ප ක්‍රියාමාර්ග මඟින් දැනට සේවයේ සිටින නිලධරයන්ගෙන් ඉටු කර ගත නොහැකි වූ ද, අත්‍යවශ්‍ය තනතුරුවලට පමණක් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශය මත විශ්‍රාමික නිලධරයෙකු මාස දොළහ (12)ක උපරිමයකට යටත්ව නිසි බලධරයාට පත් කළ හැකිය. අමාත්‍යාංශයක් යටතට නොගැනෙන දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් වන විට දෙපාර්තමේන්තු ප්‍රධානියා පෞද්ගලිකවම මෙම අවශ්‍යතාව සහතික කළ යුතුය.

III. විශ්‍රාම ලැබීමෙන් අනතුරුව, මාස දොළහ (12)ක් හෝ ඊට වැඩි කාලයක් දැනටමත් නැවත සේවයේ යොදවා ඇති නිලධරයෙකු එසේ සේවයේ යෙදවිය හැක්කේ, කොන්ත්‍රාත් පදනම මත නිමවන එකී කාල පරිච්ඡේදය දක්වා පමණක් වන අතර, අදාළ ආයතනය විසින් කරනු ලබන ඉල්ලීමක් මත, අවස්ථාවෝචිත පරිදි, එම තනතුරට අදාළ පත්කිරීමේ/ බලය පවරනු ලැබූ/ පරිපාලන බලධරයා විසින් එම පුරප්පාඩුව ස්ථිර සේවයේ සුදුසු නිලධරයෙකුගෙන් නියමිත දිනයට පුරවාලිය නොහැකි බවට ලිඛිතව දන්වා එවා ඇති අවස්ථාවක හැරුණුකොට, එකී නිලධරයා යළිත් නැවත සේවයේ නොයෙදවිය යුතුය.

IV. මොනම හේතුවක් නිසා හෝ වයස අවුරුදු 67 සම්පූර්ණ කළ කිසිවෙකු රාජ්‍ය සේවයේ අනුමත තනතුරකට පත් නොකළ යුතුය.

V. විශ්‍රාමිකයෙකු නැවත සේවයේ යොදවනු ලබන කාලසීමාව තුළ දී ආයතන ප්‍රධානියා විසින් සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනාගනු ලැබිය යුතු අතර, එම නිලධරයා පුරුදු කිරීමේ කාර්ය නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධරයාගේ වගකීමක් වශයෙන් ඔහුට පැවරිය යුතුය.

03. විශ්‍රාමික නිලධරයෙකු නැවත සේවයේ යොදවනු ලැබූ විට/ තනතුරකට පත් කරනු ලැබූ විට පහත සඳහන් පරිදි මාසික පාරිශ්‍රමිකය ලබා දිය යුතුය.

I. රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධරයෙකු සේවා කඩවීමක් සහිතව හෝ රහිතව කලින් දැරූ තනතුරේම නැවත සේවයේ යොදවනු ලබන විටෙක ඔහු රාජ්‍ය සේවයේ අවසන් වරට ලැබූ මාසික වැටුපට සමාන මාසික දීමනාවක් ගෙවීම.

II. විශ්‍රාම ලැබූ අවස්ථාවේ දී හිමිකම් තිබූ වැටුප් පරිමාණයට වඩා ඉහළ වැටුප් පරිමාණයක් සහිත වෙනත් තනතුරක නැවත සේවයේ යොදවනු ලබන විටෙක, ඔහුට රාජ්‍ය සේවයේ ඉහත 03. I හි වැටුප හෝ නැවත සේවයේ යොදවනු ලබන තනතුරේ ආරම්භක වැටුප යන දෙකින් ඉහළ වැටුපට සමාන මාසික දීමනාවක් ගෙවීම.

III. විශ්‍රාම ලැබූ අවස්ථාවේ දී හිමිකම් තිබූ වැටුප් පරිමාණයට වඩා පහළ වැටුප් පරිමාණයක් ඇති වෙනත් තනතුරක නැවත සේවයේ යොදවනු ලබන විටෙක, ඔහුට රාජ්‍ය සේවයේ ඉහත 03. I හි සඳහන් දීමනාව හෝ නව තනතුරට අදාළ වැටුප් පරිමාණයේ අනුරූපී වැටුප් පියවර යන දෙකින් අඩු වැටුපට සමාන මාසික දීමනාවක් ගෙවීම. (අනුරූපී වැටුප් පියවර යනුවෙන් අදහස් කරන්නේ විශ්‍රාම ලබන අවස්ථාවේ දැරූ තනතුරට අදාළ වූ වැටුප් පරිමාණයේ උපයාගෙන තිබූ වැටුප් වර්ධක සංඛ්‍යාව අනුරූපී වන නැවත සේවයේ යොදවා ඇති තනතුරට අදාළ වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක සංඛ්‍යාව අනුව වැටුප් පියවර වේ.)

IV. අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙර විශ්‍රාම ගොස් නැවත සේවයේ යොදවනු ලබන පුද්ගලයන්ගේ විශ්‍රාම වැටුප, ඔහු අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹෙන දිනය හෝ නැවත සේවයේ යෙදවීමේ කොන්ත්‍රාත්තුව අවසන් වන දිනය යන දෙකින් පළමුව එළඹෙන දිනය දක්වා අවුරා තැබීම.

04. මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා "අවසන් වරට ලද වැටුප" යනුවෙන් අදහස් කරන්නේ නිලධරයා විශ්‍රාම ලබන අවස්ථාවේ ලබමින් සිටි වැටුප වේ. එයට අවසාන වැටුප් වර්ධක දිනයේ සිට විශ්‍රාම යන දිනය දක්වා වන වැටුප් වර්ධකයේ උපයාගත් කොටස ඇතුළත් නොවේ.

05. නිලධරයෙකු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ලබමින් සිටි වැටුප් පරිමාණය ප්‍රතිශෝධනය වී තිබේ නම් ඔහු නැවත සේවයේ යොදවන විටක දී ඔහුගේ මාසික දීමනාව සංශෝධිත වැටුප් පරිමාණයේ අනුරූපී වැටුප් පියවර අනුව ලබා දිය යුතුය.

06. අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමෙන් අනතුරුව විශ්‍රාම ගත් නිලධරයන් නැවත සේවයේ යොදවනු ලැබූ/ පත් කරනු ලැබුවහොත් එකී විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප අවුරා තැබීමකින් තොරව දිගටම ගෙවනු ලැබේ. ඔවුන්ට විශ්‍රාම වැටුප සමඟ නියමිත ජීවන වියදම් දීමනාව ලැබෙන අතර නැවත සේවයේ යෙදවීම/ පත් කිරීම යටතේ විශ්‍රාම වැටුප සමඟ හිමිවන ජීවන වියදම් දීමනාවේ ඉතිරි අර්ධය ඔහු ලබන මාසික දීමනාව සමඟ ලබා දිය හැකිය.

07. ඉහත 03හි IV ඡේදයේ සඳහන් නැවත සේවයේ යොදවනු ලබන නිලධරයන්ට ද සංශෝධිත ජීවන වියදම් දීමනාව ලබා ගත හැකිය.

08. රජයේ සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් අනතුරුව ස්ථිර හෝ තාවකාලික තනතුරකට පත් කරනු ලබන සියලුම පුද්ගලයන්ට මෙම චක්‍රලේඛය අදාළ වේ.

09. විශ්‍රාමිකයකු නැවත සේවයට බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීමේ දී මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර එහි 13 ඡේදය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් කරුණු ඊට ඇතුළත් කිරීමට පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

I. අදාළ නිලධරයා මේ වන විට නියමිත බලධරයා විසින් විධිමත් පරිදි විශ්‍රාම ගන්වා තිබේ ද, නැති ද යන වග හා එසේ නම් සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් ද නැතහොත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීමක් ද යන වග.

II. අදාළ නිලධරයා විනය හේතුවක්, අකාර්යක්ෂමතාවක්, අසතුටුදායක සේවාවක් වැනි හේතුවක් මත විශ්‍රාම ගන්වා නොමැති බව.

III. අදාළ නිලධරයා විශ්‍රාම ලැබීමට පෙර සේවා කාලය සතුටුදායක බව හා විනය දඬුවම් ලබා නොමැති බව.

10. විශ්‍රාමික නිලධරයෙකු නැවත සේවයේ යොදවනු ලැබූ විට/ තනතුරකට පත් කරනු ලැබූ විට එම තනතුරට හිමි අනෙකුත් පහසුකම් ලබා දිය යුතුය.

11. 2018.02.01 දින වන විට නැවත සේවයේ යොදවනු ලැබ ඇති/ පත් කරනු ලැබ ඇති තැනැත්තන්ගේ මාසික දීමනාව ද ඉහත 03 ඡේදයේ සඳහන් පරිදි මෙම චක්‍රලේඛය බලාත්මක වන දින සිට සංශෝධනය කළ යුතුය.

12. මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව විශ්‍රාමික රාජ්‍ය නිලධරයෙකු නැවත සේවයේ යෙදවීමේ දී මාසික පාරිශ්‍රමිකය ලෙස දීමනාවක් ගෙවනු ලබන හෙයින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව එම නිලධරයන්ගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය නොකළ යුතුය.

13. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

## විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම

01. නිර්දේශිත නිලධරයාගේ නම :-
02. අයත් වූ සේවාව හා ශ්‍රේණිය :-
03. උපන්දිනය :-
04. ජාතික හැඳුනුම්පත් අංකය :-
05. නැවත සේවයේ යෙදවීමට නිර්දේශිත තනතුර හා එය අයත් සේවාව :-
06. කාලසීමාව :-
07. නිර්දේශිත තනතුරට අදාළ තොරතුරු :-

| අනුමත මුළු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු ඇතිවීමට හේතු | පුරප්පාඩු ඇති වූ දිනය | පුරප්පාඩු ස්ථිරව පිරවීමට ඇති බාධාවන් |
|---|---|---|---|---|
| | | | | |

08. මෙම පුරප්පාඩුව ඇති තනතුරෙහි රාජකාරි කටයුතු සේවා ස්ථානයේ සිටින වෙනත් නිලධරයන්ගෙන් ආවරණය කිරීමට නොහැකි ද යන්න හා එයට හේතු :-
09. නොඑසේ නම් මෙම තනතුරට වැඩ බැලීමේ පදනම මත පත් කළ හැකි නිලධරයන් සිටී ද/ නැද් ද යන්න හා එසේ නම් ඒ සඳහා එවැනි නිලධරයන් නිර්දේශ නොකිරීමට හේතු :-
10. නිලධරයා අවසාන වරට සේවය කරන ලද තනතුර :-
11. සේවා ස්ථානය :-
12. නිලධරයා විශ්‍රාම ගත් දිනය :-
13. විශ්‍රාම ගත් ආකාරය :-
14. මීට ප්‍රථම නැවත සේවයේ යොදවාගෙන ඇති ද යන වග :-
15. එසේ නම් ඒ කුමන තනතුරකට ද යන වග, ඒ සඳහා අනුමැතිය ලබා දුන්නේ කවුරුන් විසින් ද යන වග හා අදාළ පත්වීමේ කාලසීමාව :-
16. මෙම නිලධරයා නිර්දේශ කිරීමට විශේෂිත වූ කරුණු :-
17. නිලධරයාට එරෙහිව විනය පරීක්ෂණ පවතී ද/ පැවතියේ ද යන වග :-
18. නිලධරයාට එරෙහිව විනය පරීක්ෂණ පැවතියේ නම් විනය නියෝගය කුමක් ද යන වග :-

දිනය :- ..........................................

දෙපාර්තමේන්තු ප්‍රධානියා

දිනය :- ..........................................

අමාත්‍යාංශ ලේකම්